46 වන පිටෙන්

ජනතාවාදී වැඩ කඩාකප්පල් කරමින් සිට කිසිම ගින්නක් නැතිව තව අවුරුදු එකහමාරකින් බලයට එන්නට හැකියාව ඇස් පනාපිට පෙනිපෙනීත් කාගේදෝ ගොන් ලුණුවක් කා අතේ තිබුණ දේ කටේ දාගන්නට නොහැකි තත්වයකට තත්වයකට පත්වී ගලේ පැහැරූ බළලෙකුගේ මට්ටමට විපක්ෂය වැටී ඇති නිසාත්

රටේම නායකයා ලෙස හැට දෙලක්ෂයක් ජනතාවගේ මනාපයෙන් කොහේදෝ සිටි ගමයෙක් රටේ නායකයා ලෙස පත්වී එදා පටන් කෙළීන පිස්සු නාඩගමේ කූටප්‍රාප්තියට එළැඹ ගෙදර ගියොත් අඹු නසී මග හිටයොත් තෝ නසී තත්වයට පත්ව ඇති නිසාත්

මේ තුන්කට්ටුවේම නායකයන් තිදෙනාම නාඳුණන තුවක්කුකරුවාගේ..... (එක්කො මෙතනින් නවත්නමු නේද?)
මේකත් මැච් එකක්

ඇයි මේ කට්ටිය විස්සෝප වෙලා ලංකාවේ වෙන්නේ මොකද කියලා මේ තරම් උනන්දුවෙන් රේඩියෝ එකෙන් ඔඩ එකෙත් අන්තර්ජාලෙත් හොයන්නේ අම්මපා හරියට ශ්‍රී ලංකාව වන්ඩේ මැච් එකක් ගහන කොට සැරින් සැරේ ස්කෝර් එක බලනවා වගේ. නිවුස් බලනවා ෑ නිවුස් බලනවා ගොසිප් පිටුව බලනවා. දැන් මහින්ද කීයද රනිල් කීයද 100 පැනලද තාම 113ක් නැද්ද මාර ආතල් එකක්නේ බොලේ මේ. පිස්සු පීකදු වෙනවා ලොක්කා අපි තරම් ලෝකෙට ආතල් දෙන ජාතියක් තවත් ඇද්ද? මොන මඟුල කරන්න ගියත් ඇන ගන්නවා. තුන්පලේම ගා ගන්නවා. හැමදම කරන්නේ මේ තුන්ලෝකෙම එවුන් නොකරන වැඩමයි. ලැජ්ජාවේ මැරෙන්න හිතෙනවා.

ලංකාවේ දැන් තියෙන තත්වය ගැන චූටි මල්ලිගේ අදහස මෙහෙමයි. අවුරුදු තුනහමාරක් රටක් පාලනය කරඑ යූඑන්පී ප්‍රමුඛ ආණ්ඩුවට තමන්ගේය කියා පත්තරයක් ටීවී එකක් රේඩියෝ එකක් පොලිසියක් හමුදාවක් ගොඩ නගා ගැනීමට නොහැකිවී තිබීමත් ඒ නිසාම මොන ජාත්‍යන්තර සහය ලැබුණත් අධිකරණ තීන්දු ලැබුණත් කිසිත් කරකියා ගැනීමට නොහැකි වී සිටීම නිසාත්

අවුරුදු තුනහමාරක් තිස්සේ තිබුණ ආන්ඩුවට මෙලෝ වැඩක් හරියාකාරව කරන්නට ඉඩ නොදී වර්ජන කරමින් ජඩ මාධ්‍ය භාවිතාවක යෙදෙමින් රජය හා ජනතාව අතර සම්බන්ධය බිඳ දමමින් රජයේ සියලුම ජනතාවාදී වැඩ කඩාකප්පල් කරමින් සිට කිසිම ගින්නක් නැතිව තව අවුරුදු එකහමාරකින් බලයට එන්නට හැකියාව ඇස් පනාපිට පෙනිපෙනීත් කාගේදෝ ගොන් ලුණුවක් කා අතේ තිබුණ දේ කටේ දාගන්නට නොහැකි තත්වයකට තත්වයකට පත්වී ගලේ පැහැරූ බළලෙකුගේ මට්ටමට විපක්ෂය වැටී ඇති නිසාත්

රටේම නායකයා ලෙස හැට දෙලක්ෂයක් ජනතාවගේ මනාපයෙන් කොහේදෝ සිටි ගමයෙක් රටේ නායකයා ලෙස පත්වී එදා පටන් කෙළීන පිස්සු නාඩගමේ කූටප්‍රාප්තියට එළැඹ ගෙදර ගියොත් අඹු නසී මග හිටයොත් තෝ නසී තත්වයට පත්ව ඇති නිසාත්

මේ තුන්කට්ටුවේම නායකයන් තිදෙනාම නාඳුණන තුවක්කුකරුවාගේ..... (එක්කො මෙතනින් නවත්නමු නේද?)







## ප්‍රවේසමෙන්

සෙන් ඇදුරු සෙන්ගයි යටතේ ශිෂ්‍යයන් ගණනාවක් අධ්‍යාපනය ලැබුවා. එක් තරුණයෙක් රාත්‍රී කාලයේ තාප්පයෙන් පැන ලෞකික සැප සොයා ගියා. ශිෂ්‍ය නවාතැන් පරීක්ෂා කළ සෙන්ගයි මෙකී ශිෂ්‍යයා නැති බව දැන ගත්තා. තාප්ප යට නගින්නට ආධාර වශයෙන් ඊට හේත්තු කර තිබූ කුඩා මේසය ද ඔහු දුටුවා. ඔහු මේසය ඉවත් කර එතැන හිටගත්තා. ශිෂ්‍යයා පාන්දර යාමයේ තාප්පයේ උඩ සිට ගුරුවරයාගේ හිස මතට පය තබා බිමට පැන්නා. තමාට සිදු වූ වරද අවබෝධ කර ගත් ඔහු බියට පත් වුණා.

"හිමිදිරි කාලයේ හොඳට ම සීතලයි. සෙම්ප්‍රතිශ්‍යාව වැළඳෙන්නට ඉඩ තියෙනවා. ප්‍රවේශමෙන්." සෙන්ගයි කිව්වා.

එදා සිට සිසුවා කිසි දවසක රාත්‍රී කාලයේ පිටතට ගියේ නෑ.

## ඔබේ සිත

විශ්ව විද්‍යාල මහාචාර්යවරයෙක් ප්‍රසිද්ධ සෙන් ගුරුවරයෙක් මුණ ගැසෙන්නට ගියා. ගුරුවරයා තේ සූදානම් කරන අතරේ මහාචාර්යවරයා සෙන් ගැන කතා කරන්නට පටන් ගත්තා.

සෙන් ඇදුරා අමුත්තාගේ කෝප්පය පිරෙන තෙක් තේ වත් කළා. ඒත් ඔහු තවමත් වත් කරනවා. මහාචාර්යවරයා උතුරා යන කෝප්පය දෙස බලා සිටියා. ඉවසාගෙන ඉන්න බැරි තැන ඔහු කථා කළා. "ඒක පිරිලා උතුරලා යනවා. ඒකට තව දාන්න බෑ."

"ඔබ මේ කෝප්පය වගෙයි." ගුරුතුමා පිළිතුරු දුන්නා. "ඔබ ඔබේ අදහස්වලින් සිත පුරවාගෙන. ඔබේ කෝප්පය හිස් කරන්නේ නැත්තම් මං කොහොමද ඔබට සෙන් පෙන්වා දෙන්නේ?"

සෙන් ඇදුරා අමුත්තාගේ කෝප්පය පිරෙන තෙක් තේ වත් කළා. ඒත් ඔහු තවමත් වත් කරනවා. මහාචාර්යවරයා උතුරා යන කෝප්පය දෙස බලා සිටියා. ඉවසාගෙන ඉන්න බැරි තැන ඔහු කථා කළා. "ඒක පිරිලා උතුරලා යනවා. ඒකට තව දාන්න බෑ."

"ඔබ මේ කෝප්පය වගෙයි." ගුරුතුමා පිළිතුරු දුන්නා. "ඔබ ඔබේ අදහස්වලින් සිත පුරවාගෙන. ඔබේ කෝප්පය හිස් කරන්නේ නැත්තම් මං කොහොමද ඔබට සෙන් පෙන්වා දෙන්නේ?"



මහින්ද ගුණවර්ධන



**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au